# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
# பதிவாளர் நாயகம் திணைக்களம்
# REGISTRAR GENERAL'S DEPARTMENT

චක්‍රලේඛ අංක :- 06/2020

| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | RG/MBD/1/චක්‍රලේඛ | ප්‍රධාන කාර්යාලය<br>தலைமை அலுவலகம்<br>HEAD OFFICE | තැ. පෙ. අංකය<br>த. பெ. இல.<br>P. O. Box No. 565 |
| ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | 234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.<br>234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.<br>234/A3, Denzil Kobbakaduwa Mawatha, Battaramulla. | දිනය<br>திகதி<br>Date 2020.05. |


සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්/ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්
අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් වෙත

**<u>කෝවිඩ්19 වසංගත තත්ත්වය හේතුවෙන් විවාහ දැන්වීම් භාරදී නියමිත කාල සීමාව තුළ විවාහ ලියාපදිංචි කර ගැනීමට අපොහොසත් වූ අයවළුන් සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කිරීම</u>**

කෝවිඩ්19 ගෝලීය වසංගත තත්ත්වය හේතුවෙන් සාමාන්‍ය රාජකාරී කටයුතු වලින් බැහැර වීමට සිදු වීම නිසා විවාහ දැන්වීම රෙජිස්ට්‍රාර්වරයා වෙත භාර දී තිබුණද නිසි කාල සීමාව තුළ එනම් මාස තුනක කාල සීමාව ඇතුලත විවාහය ලියාපදිංචි කර ගැනීමට නොහැකි වූ පිරිසක් සිටින බව මා වෙත වාර්තා වී ඇත.

02. එබැවින් මෙම වසංගත තත්වය හේතුවෙන් නිසි කාල සීමාව තුල විවාහ ලියාපදිංචි කර ගැනීමට නොහැකි වූ අය සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

I. මෙම ප්‍රතිපාදන අදාල වන්නේ 2019.12.15 වන දිනත් 2020.03.15 දිනත් අතර කාල සීමාව තුල භාරදුන් විවාහ දැන්වීම් සඳහා වේ.
II. විවාහ දැන්වීමේ කාලසීමාව (මාස 3) ඉක්මවා ඇත්නම් පහතේ ප්‍රතිපාදන අනුව නව විවාහ දැන්වීමක් අනිවාර්යයෙන්ම භාරගත යුතු වේ.
III. කොට්ඨාශ අතර හුවමාරු වන විවාහ දැන්වීමක් නම් තැපැල් මගින් හෝ අතින් භාරගත නොහැකි නම් Fax ,e-mail, Whats app හෝ වෙනත් මාධ්‍යයකින් භාරගෙන පසුව විවාහය සිදුකරන අවස්ථාවේදි මුල් ලියවිලි භාර ගැනීම සුදුසු වේ.
IV. ඉන්පසු කලින් විවාහ දැන්වීම භාරගත් අවස්ථාවේදී විවාහ දැන්වීම සඳහා ගෙවන ලද ගාස්තුව හා ලියාපදිංචිය සඳහා ද ගාස්තු ගෙවා ඇත්නම් එම ගාස්තු නව දැන්වීමට හුවමාරු වන බවට සටහනක් යොදා නැවත ගාස්තු අය කිරීමකින් තොරව විවාහය ලියාපදිංචි කල යුතු වේ.

මෙම ක්‍රියා පටිපාටියම අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් විසින් භාරගත් විවාහ දැන්වීම් සඳහා ද අදාල කරගන්නා ලෙසත් මේ පිළිබඳව විවාහ රෙජිස්ට්‍රාර්වරුන් දැනුවත් කරන ලෙසත් වැඩි දුරටත් දන්වා සිටිමි.

එන්.සී. විතානගේ
රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත්:-

1. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය. - දැනගැනීම සඳහා (පිටු අංක 1)


දුරකථන අංකය / தொலைபேசி இல. / Telephone No. 2889488, 2889489
ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No. 2889491
වෙබ් අඩවිය / இணையத்தளம் / Website www.rgd.gov.lk
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail rgd@sltnet.lk, rg@rgd.gov.lk

2. සියළුම දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - දැනගැනීම සඳහා

[redacted] භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - දැනගැනීම සඳහාසහ අවශ්‍ය කටයුතු සඳහා

4. ප්‍රධාන කාර්යාලයේ සියළුම මාණ්ඩලික නිලධාරීන් වෙත - දැනගැනීම සඳහා

5. මධ්‍යම ලේඛනාගාරයේ සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් - දැනගැනීම සඳහා

6. සියළුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් - දැනගැනීම සඳහා

(පිටු අංක 2)